# භෞතික සම්පත් සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් නූතන ලෝකයට යොදාගත හැකි ආකාරය

පූජ්‍ය. වලස්මුල්ලේ සුදස්සන හිමි, ආරච්චිල්ලාය ඕෂධී නිමේෂා ජයවර්ධන*

බුදු දහම සියවස් 25 කටත් වඩා පැරණි ආගමික දර්ශනයක් බැවින් එහි ඉගැන්වීම් නූතන ලෝකයට ගැළපේද යන්න විමසා බැලිය යුත්තකි. මුල් බුදුසමයේ ඉතා වැදගත් ඉගැන්වීමක් වන භෞතික සම්පත් සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් නූතන ලෝකයට ගැළපේද යන්න විමසීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

භෞතික සම්පත් සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් තුළ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ දෙකකි. පළමුව භෞතික සම්පත් විනාශයට හේතුවන සාධක පෙන්වාදී ඒවායින් වැළකීමට මගපෙන්වීමයි. දෙවනුව භෞතික සම්පත් සංරක්ෂණය සඳහා කළයුතු ක්‍රමවේදයන් හා අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත ඉදිරිපත් කිරීමයි. මෙම ක්‍රමය ගැටලු විසඳීමේදී යොදාගත හැකි සාර්ථක ක්‍රමයකි. සම්පත්වලින් උපරිම ප්‍රයෝජන සලසා ගැනීම නව සම්පත් ගවේෂණයට වඩා ප්‍රමුඛතාව ලබාදීම බුදුදහමේ විශිෂ්ට ලක්ෂණයකි.

මිනිසාට භෞතික සම්පත්වලින් තොරව පැවැත්මක් නැත. එබැවින් භෞතික සම්පත් මැනවින් සංරක්ෂණය කොට කළමනාකරණය කිරීම මිනිසාගේ යහපැවැත්මට අත්‍යවශ්‍ය වන්නකි. වසර දහස් ගණනාවක් පැරණි බෞද්ධ ඉගැන්වීම් තුළින් භෞතික සම්පත් සංරක්ෂණය කළ හැකිද යන ගැටලුව මතුකොට ත්‍රිපිටකය මූලාශ්‍රය වශයෙන් ගෙන එය විසඳීම මෙම අධ්‍යයනයෙන් සිදු වෙයි. පැරණි බෞද්ධ ඉගැන්වීම් තුළින් භෞතික සම්පත් සංරක්ෂණය පිළිබඳ නූතන ලෝකයේ දැනුම පෝෂණය කිරීමට හැකිවීම මෙහි ප්‍රතිඵලයයි.

ප්‍රමුඛ පදඃ භෞතික සම්පත්, සංරක්ෂණය, බෞද්ධ ඉගැන්වීම්, නූතන ලෝකය

* wsudassana@gmail.com / jayawardanaarachchillaya@gmail.com